# ඉන්සියුලින් භාවිතය

- ඉන්සියුලින් විදින ස්ථාන මාරු කරන්න.
- ඉන්සියුලින් සිරින්ජරයේ කටුවේ ප්‍රමාණය 30 G හෝ 31G වේ.


## ඉන්සියුලීන් සිරින්ජරය නැවත භාවිතයේදී සැලකිය යුතු කරුණු

- උපරිම වශයෙන් දින 3 ක් හෝ 4 ක් භාවිතා කළ හැකිය. ඊට වැඩි වාර ගණනක් භාවිතා කිරීමට යාමෙන් තුඩෙහි තියුණු බව නැති වීම නිසා වේදනාකාරී වීම සහ විෂබීජ ඇතුල් වීමට ඇති ඉඩ කඩ වැඩි වේ
- විදීමෙන් පසු එය ප්ලාස්ටික් කොපුවෙන් වසා ඉන්සියුලින් කුප්පිය සමඟ තබන්න.
- ඉඳි කටුව කිසිවිටෙකත් අතින් ඇල්ලීම හෝ ස්ප්‍රීතු වලින් පිරිසිදු කිරීම නොකළ යුතුය.
- ඉන්සියුලින් විද ගැනීම කිසි විටෙකත් වේදනාකාරී නොවේ. එසේ වේදනාකාරී බවක් දැනේ නම් පහත කරුණු අනුගමනය කරන්න.
- සිරින්ජරය තුළ වායු බුබුළු තිබේ නම් කටුව උඩ පැත්තට හරවා සිරින්ජරයේ බඳට ඇඟිල්ලෙන් තට්ටු කර ඒවා ඉවතට යවන්න.
- ඉන්සියුලින් විදින ස්ථානය අවට මාංශ පේෂීන් ලිහිල්ව තබා ගන්න.
- සම තුල දී කටුවේ දිශාව වෙනස් නොකර ඉක්මණින් ඉන්සියුලින් විද ගන්න.
- ඉන්සියුලින් කටුව මොට වී ඇති නම් අලුත් කටුවක් භාවිතා කරන්න..


www.srilankadiabetesfederation.lk

## ඉන්සියුලින් ගබඩා කර තැබීමට උපදෙස්

හැකි සෑම අවස්ථාවකදීම ශීතකරණයේ : 2°C – 8°C) උෂ්ණත්වයේ තබන්න.



ඉන්සියුලීන් කිසිවිටෙකත් අධි ශීතකරණයේ ගබඩා කිරීමෙන් වළකින්න. හිරු එළිය වැටෙන ස්ථාන වල සහ තද රස්නය ඇති ස්ථාන වල තැබීමෙන් වළකින්න.




ශීතකරණයක් නොමැති අවස්ථාවල ඉන්සියුලීන් ගබඩා කිරීම




SRI LANKA DIABETES FEDERATION

SLCE Sri Lanka College of Endocrinologists

SLDC Sri lanka Diabetes & Cardiovascular Disease Initiative


# ඉන්සියුලින්

**ඉන්සියුලින්** යනු හෝමෝනයකි. එය නිපදවනු ලබන්නේ අග්නාශ්‍යය නමැති ග්‍රන්ථියෙනි. ඉන්සියුලින් නිපදවීම අඩුවීම හෝ එහි ක්‍රියාකාරිත්වය අඩුවීම හේතුවෙන් ග්ලූකෝස් වලට දේහ සෛල තුළට ඇතුළු වීමේ හැකියාව අඩුවන නිසා ග්ලූකෝස් රුධිරයේ එකතු වේ. එවැනි විටෙක රුධිරගත සීනි මට්ටම සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩි වේ.

## ඉන්සියුලින් අවශ්‍ය වන්නේ කා හටද?

- TYPE 1 - පළවෙනි වර්ගයේ දියවැඩියා තත්ත්වයෙන් පෙළෙන රෝගීන්ට මෙය අත්‍යවශ්‍ය වේ.
- TYPE 2 - දෙවන වර්ගයේ දියවැඩියා රෝගීන් සඳහා සමහර විටෙක ගිලින පෙති වෙනුවට හෝ පෙති සමඟ අවශ්‍ය වේ.
- රෝගී අවස්ථාවලදී හා ගර්භණී අවස්ථා වලදී ද ගිලින පෙති වෙනුවට හෝ පෙති සමඟ අවශ්‍ය වේ.

## ඉන්සියුලින් විදිය හැකි ස්ථාන



01 ඉදිරිපස
02 පසුපස

01 තමා විසින් විද ගත හැකි ස්ථාන

02 වෙනත් අයෙකුගේ සහය ඇතුව විද ගත හැකි ස්ථාන

www.srilankadiabetesfederation.lk


## ඉන්සියුලින් නිවැරදිව විදින ආකාරය




දෙ අත් සෝදා ගන්න
කුප්පිය ඇතුලේ සුදු ස්පටික හෝ කුඩු වැනි තැන්පත් වීමක් හෝ දුඹුරු වී ඇත්නම් භාවිතයෙන් වලකින්න.
ඉන්සියුලීන් කුප්පිය එක අත්ලක් මත අනෙක් අත්ල තබා සෙමෙන් රෝල් කරන්න




උඩ ඇති ප්ලාස්ටික් කොපුව ඉවත් කරන්න



ගත යුතු ඉන්සියුලීන් ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් වායුව සිරින්ජරය තුලට ලබා ගන්න



බෝතලය තුලට සිරින්ජරයේ තුඩ ඇතුලත් කර සිරින්ජරය තුලට ලබාගත් වායු ප්‍රමණය කුප්පිය තුලට යවන්න




බෝතලය උඩුයටිකුරු අල්ලා ගනිමින් විදිය යුතු ඉන්සියුලීන් ප්‍රමණය සිරින්ජරයට ගන්න




වායු බුබුළු ඇත්නම් ඒවා ඉවත් කරගන්න



ඉන්සියුලීන් විදින ස්ථානය තෝරා ගන්න



සමෙහි කොටස රැලි වැටෙන සේ අල්ලා ගන්න සිරින්ජරය පෑනක් අකාරයට අල්ලා ගන්න



අල්ලා ගත් කොටසට සිරින්ජරයේ තුඩ ඇතුලත් කර එන්නත් කරන්න
තත්පර 5 කට පසු කටුව ඉවත් කරන්න



සිරින්ජර බදුනකට දමා තබා ගන්න

*ඉන්සියුලීන් නිවැරදිව විදින අකාරය පිළිබඳව සායනයේදී ඔබ දැනුවත් කරනු ඇත.*